# ශ්‍රී ලංකාවේ වර්තමාන අඳ ගොවි ක්‍රමය; අභියෝග හා විසඳුම්

ආර්.එල්.එන්. ජයතිස්ස
චතුර විජේතුංග

## සංක්ෂේපය

වර්තමාන ගොවිජන සමාජය තුළ අඳ ගොවියා හා අඳ ගොවි ක්‍රමය පිළිබඳ ව ප්‍රබල ව සාකච්ඡාවට භාජනය වෙයි. 1958 කුඹුරු පනත මඟින් කරළියට ගෙන ආ අඳ ගොවීන්ගේ විවිධ අයිතිවාසිකම් හා වගකීම් ඇතුළත් පනත මේ දක්වා විවිධ පරිණාමයන්ට බඳුන් වෙමින් ගොවිජන සමාජය තුළ ක්‍රියාත්මක වේ. හම්බන්තොට, මාතර හා අනුරාධපුර දිස්ත්‍රික්ක ආශ්‍රිත ව තෝරා ගත් කෘ.ප.නි.ස. කොට්ඨාසවල සිදු කරන ලද අධ්‍යයනයක් පදනම් කරගනිමින් මෙම ලිපිය සකස් කර ඇති අතර, එම අධ්‍යයනයේ අරමුණ වූයේ, වර්තමානයේ ක්‍රියාත්මක 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත නිසා අඳ ගොවීන් හා ඉඩම් හිමියන් මුහුණ පා ඇති ගැටළු පිළිබඳ විමර්ශනය කිරීමත්, ඒ මඟින් නව අඳ ගොවි පනතක් සකස් කිරීම සඳහා පනත තුළ සිදුවිය යුතු සංශෝධන පිළිබඳ ව ගොවිජන සමාජයේ අදහස් ලබා ගැනීමත් ය. අඳ ගොවියකු මිය ගිය පසු ඔහුගේ උරුමකරුවන්ට අනුප්‍රාප්තිය හිමිවීමේ ක්‍රමයක් සඳහන් නො වීමත් යෝජිත ගොවිජන විනිශ්චය සභා ක්‍රියාත්මක නො වීමත්, ප්‍රවේණිය ගෙවීම පිළිබඳ එකඟතාවයක් නො තිබීමත් නිසා වර්තමාන අඳ ගොවි ක්‍රමය ගැටළුකාරී තත්ත්වයකට මුහුණ පා ඇති බව අධ්‍යයනය තුළින් හෙළිදරව් විය. අඳ ගොවි ආරවුල් විශාල වශයෙන් දක්නට ලැබෙන අතර, අඳ ගොවියා මෙන් ම ඉඩම් හිමියා ද පවතින පනත නිසා දුෂ්කරතාවයන්ට මුහුණ පා ඇත. මෙම ගැටළු නිරාකරණය කිරීම සඳහා නව ගොවිජන සංවර්ධන පනතක් සකස් කර කඩිනමින් ක්‍රියාවට නැංවීමත්, පවතින පනත නිසා අසාධාරණයට ලක්වූවන්ට සාධාරණයක් සැලසීම සඳහා එය වර්ෂ 2000 සිට බලාත්මක වන අයුරින් ක්‍රියාත්මක කිරීමත් කාලීන අවශ්‍යතාවයක් බව මෙම ලිපියෙන් අවධාරණයට ලක් කෙරේ.

## 1. හැඳින්වීම

කුඹුරු පනත ඉදිරිපත් කිරීමට තුඩු දුන් සමාජ ආර්ථික පසුතලයට දීර්ඝ ඉතිහාසයක් ඇත. සිංහල රාජ්‍ය සමයේ මෙරට ක්‍රියාත්මක වූයේ වැඩවසම් සමාජ සංවිධානයකි. රටේ සියළු ම ඉඩම් රජු සතු ව පැවතුණි. රජු වෙනුවෙන් රාජකාරිය කිරීම හා ජීවත්වීම සඳහා ඉඩම් ලබාදී තිබුණි. ඒ රටේ සිටි ප්‍රභූ පන්තිය වෙත ය. මහනුවර යුගයේ දී උඩරට රදළයන්, පහතරට වලව් වැනි සමාජයේ ප්‍රභූන් අතට මෙසේ විශාල ඉඩම් ප්‍රමාණයක් ලැබුණි. මෙයට අමතර ව පූජනීය ස්ථාන සඳහා පූජා කළ ඉඩම් ප්‍රමාණය ද විශාල ය. මෙම ඉඩම් වගා කිරීම සඳහා සමාජයේ ඉඩම් නොමැති පුද්ගලයන්ට ලබා දී තිබුණි. ඉඩම්වල එළදාවෙන් වැඩි කොටස හිමි වූයේ ඉඩම් වගා කළ ගොවියාට නොව ඉඩම් හිමියාට ය.

කුඹුරු වගා කළ ගොවීන් වර්ග තුනකට අයත් විය. ඒ ඉඩම් හිමි ගොවීන්, කුලී ගොවීන් හා අඳ ගොවීන් යනුවෙනි. ඉඩම් අයිතිකරු කුඹුරක් වගා කරන්නේ නම්, ඔහු ඉඩම්හිමි ගොවියා වේ. දෛනික කුලියට ඉඩම් වගා කළ ගොවියා කුලී ගොවියා ලෙස සැලකුණි. වෙනත් කෙනෙකුගේ කුඹුරක් වගා කළ ගොවියා අඳ ගොවියා ලෙස හැඳින්විණි. මේ ක්‍රම අතුරින් අඳ ගොවියාගේ තත්ත්වය බෙහෙවින් කණගාටුදායක විය. වෙනත් ඉඩම්වල අයිතියක් නොමැති වූ ඔහුට අඳ

ක්‍රමයට වගා කළ කුඹුරෙන් ලැබුණේ අස්වැන්නෙන් 1/4 ක් හෝ 1/3 ක් තරම් සුළු කොටසකි. වැඩි කොටස ලබා ගත්තේ ඉඩම් හිමියා ය. ඒ නිසා ඔහු ණය බරින් මිරිකුණි. ඉඩම් හිමියාට තමන් කැමති විටෙක අඳ ගොවියා ඉඩමෙන් ඉවත් කිරීමේ හැකියාව තිබුණි. එබැවින් ඔහුගේ ජීවිකා වෘත්තිය අස්ථිර විය. සිය රැකියාවේ ස්ථිරත්වය උදෙසා ඉඩම් හිමියාගේ සිත දිනාගත යුතු වූ හෙයින් අඳගොවියාට කුඹුරු හිමියාගේ සියළු ම බැල මෙහෙවර කරන්නට ද සිදු වී තිබුණු අතර, ඔහු වහලෙකුගේ තත්ත්වයට ද පත් වී තිබුණි (හැන්සාඩ් වාර්තාව, 2000).

1956 බලයට පත් මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුවේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යවරයා වශයෙන් පිලිප් ගුණවර්ධන මහතා විසින් කුඹුරු පනත නිර්මාණය කරන ලද්දේ ඉහතින් සඳහන් කරන ලද සමාජ ආර්ථික පරිසරයන් තුළ ය. අඳ ගොවියාගේ දාසභාවය තුරන් කොට ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට ඔහු වඩාත් සක්‍රීය ලෙස යොමු කිරීම හා ඔහුගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම කුඹුරු පනතේ මූලික අරමුණ විය. 1958 අංක 01 දරණ කුඹුරු පනත නමින් හැඳින්වූ මෙම පනත 1958 පෙබරවාරි 2 වන දින පාර්ලිමේන්තුවේ දී සම්මත විය. කුඹුරු පනත අනුව අඳ ගොවියා කැමති විටෙක ඉවත් කරන්නට ඉඩම් හිමියාට තිබූ අසීමිත බලය අහෝසි කෙරිණි. ක්‍රමික ව සුළු සුළු වෙනස්කම්වලට භාජනය වෙමින් කාලීන අවශ්‍යතාවයන් අනුව 1973, (කෘෂිකාර්මික ඉඩම් පනත), 1979 (ගොවිජන සේවා පනත) හා 1991 (ගොවිජන සේවා පනත) යන වර්ෂවල දී නව පනත් ඉදිරිපත් කරන ලදී. මෙම පනත් මගින් අඳ ගොවීන් හා ඉඩම් හිමියන් යන දෙපිරිස ම ආරක්ෂා කිරීම අරමුණ විය. ඉන්පසු ව ඉදිරිපත් කරන ලද වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත අඳ ගොවියා නැමති පුද්ගලයා ඉඩම් හිමියකු බවට පත් කිරීමේ අරමුණින් ඉදිරිපත් කරන ලද්දකි.

වර්තමාන ශ්‍රී ලංකාවේ වී වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් 13% ක් අඳ භුක්ති ක්‍රමය මත වගා කරන බව 2008 දත්ත අනුව හෙළි වේ. මෙයට සම්බන්ධ වී සිටින අඳ ගොවීන් සංඛ්‍යාව ද 245,603 ක් තරම් අතිවිශාල ය (කෘෂිකාර්මික සංඛ්‍යාන දත්ත වාර්තාව, 2002). ප්‍රධාන වී වගා ප්‍රදේශයක් වන හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පමණක් 2010 වර්ෂය වන විට අඳ ගොවීන් 16,767 දෙනෙකු සිටි බවට වාර්තා වූ අතර, ඔවුන් විසින් හෙක්ටයාර 6,979 ක වී වගා කරනු ලැබූ බව ද දැනගන්නට ඇත (ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, හම්බන්තොට). මෙම කරුණු අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන වී වගා දිස්ත්‍රික්කයක් වන හම්බන්තොට දිස්ත්‍රික්කයෙ හි ගොවි ජනතාව අතුරින් සැලකිය යුතු ප්‍රතිශතයක් අඳ ගොවීන් බව පෙනේ.

ඉහත සඳහන් කළ පරිදි, වර්තමාන අඳ ක්‍රමය තුළ ගැටළු රාශියක් පැන නැඟී ඇති අතර, ඒවා බොහොමයක් වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත ඉදිරිපත් කිරීමෙන් පසු අලුතින් පැන නැගුණු ඒවා වෙයි. උදාහරණ ලෙස එම පනතට අනුව අඳ ගොවිතැන සඳහා අනුප්‍රාප්තිකයකු නම් කිරීමට හැකියාවක් නො තිබේ. මේ නිසා ඉඩම් හිමියන් විසින් නීත්‍යානුකූල අඳ ගොවියා මිය ගිය පසු ඔහු වගා කරමින් සිටි කුඹුරු ඉඩම බලෙන් උදුරා ගැනීමට ක්‍රියා කරන ලද අතර, මේ තත්ත්වය මත අඳ ගොවීන් හා ඉඩම් හිමියන් අතර ආරවුල් විවිධ ප්‍රදේශවලින් වාර්තා විය. ප්‍රවේණිය ගෙවීම සම්බන්ධ ව ද ඉඩම් හිමියන් හා අඳ ගොවීන් අතර එකඟතාවයක් නොමැති වීම මත ප්‍රවේණි ආරවුල් ද බහුල විය. උදාහරණයක් ලෙස හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන 14 ක් තුළ 2009 වර්ෂයේ දී පමණක් අඳ ගොවිතැන සම්බන්ධ ව වාර්තා වී ඇති ගැටළු සංඛ්‍යාව 424 කි. වර්ෂ 2000 ගොවිජන සංවර්ධන පනත යටතේ පිහිටුවීමට නියමිතව තිබූ ගොවිජන විනිශ්ච සභා මෙතෙක් පිහිටුවීමට කටයුතු නො කිරීම නිසා අඳ ගොවිතැනට අදාළ පැමිණිලි රාශියක් එකරාශී වී තිබේ. මෙම ආරවුල් සහගතතත්ත්වය හා අඳ ගොවි අයිතිය පිළිබඳ සුරක්ෂිතතාවයක් නොමැති බව, ගොවිජන සමාජය තුළ ඉඩම් හිමියන් හා අඳ ගොවීන් අතර සුහදත්වය පළුදු වීමටත්, වී නිෂ්පාදනයේ ඵලදායිතාවය අඩු වීමටත් පමණක් නොව, අවසාන වශයෙන් රටේ ජාතික නිෂ්පාදනයේ පසුබෑමක් ඇති කරවීමටත් සමත්

වේ. මෙම තත්ත්වය තුළ අද ගොවීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ක්‍රියා කිරීම කාලීන අවශ්‍යතාවයක් බව "මහින්ද චින්තන ඉදිරිදැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් ද අවධාරණය කරයි. "ශ්‍රී ලංකාව තුළ අද ගොවි පවුල් මුහුණපාන අනාරක්ෂිත බව සඳහා පැහැදිලි විසඳුමක් ලබාදිය යුතු බව මාගේ විශ්වාසය යි," යනුවෙන් එහි දක්වා ඇත (මහින්ද චින්තන ඉදිරි දැක්ම, පිටුව 83).

මෙම අද ගොවි ගැටළුවලට පිළියමක් ලෙස වසර කිහිපයකට පෙර සිට නව පනතක් නිර්මාණය කර ඇති නමුත්, එහි යම් යම් කරුණු සම්බන්ධයෙන් විවේචන එල්ල වී තිබේ. එම නිසා අද ගොවීන් මුහුණපා සිටින අනාරක්ෂිත බව හා ඔවුන් මුහුණ පාන බාධක හඳුනා ගැනීමත්, ඒ තුළින් අද ගොවීන්ගේ සුරක්ෂිතතාවය නැවත ඇති කිරීම සඳහා වන නව පනතක් සකස් කිරීම සඳහා ගොවිජන සමාජයේ අදහස් ලබා ගැනීමත් කාලීන අවශ්‍යතාවයක් වේ. විශේෂයෙන් ම මේ වනවිට කෙටුම්පත් කර ඇති පනත පිළිබඳ ව ගොවිජන අදහස් ලබා ගැනීම ද වැදගත් වේ. මෙම අධ්‍යයනය ඒ සඳහා දරන ලද උත්සාහයකි.

## 2. අධ්‍යයනයේ පරමාර්ථ

ඉහත කී අධ්‍යයනයේ මූලික පරමාර්ථය වූයේ, වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අද භුක්ති ක්‍රමය හා එහි පවතින ගැටළු පිළිබඳ ව සොයා බැලීමත්, ඒ තුළින් අද ගොවීන් සහ ඉඩම් හිමියන් යන දෙපාර්ශ්වයේ ම අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ විධිවිධාන සහිත වූ නව පනතක් සකස් කිරීම සඳහා ගොවිජන සමාජයේ අදහස් හා යෝජනා ලබා ගැනීමත් ය.

### විශේෂිත පරමාර්ථ

1. 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත ඉදිරිපත් කිරීමෙන් පසු අද භුක්ති ක්‍රමය සම්බන්ධයෙන් ක්ෂේත්‍රයේ උද්ගත වී ඇති ප්‍රශ්න සහ ගැටලු හඳුනා ගැනීම.
2. අද ගොවීන් මෙන් ම ඉඩම් හිමියන් මුහුණපා ඇති ප්‍රශ්න හා ගැටළුවලට පිළියම් ලෙස දැනට යෝජිත පනත් කෙටුම්පත පිළිබඳ අද ගොවීන්, ඉඩම් හිමියන් හා ගොවිජන සමාජයේ අදහස් ලබා ගැනීම.
3. අද ගොවියාත් ඉඩම් හිමියාත් යන දෙපක්ෂය ම තෘප්තියට පත් වන ආකාරයේ තිරසාර අද භුක්ති ක්‍රමයක් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා වූ යෝජනා ඉදිරිපත් කිරීම.

## 3. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික හා ද්විතියික දත්ත භාවිතා කරනු ලැබිණි. ප්‍රාථමික දත්ත ලබා ගැනීම අද ගොවීන් මෙන් ම ඉඩම් හිමියන් සමඟ කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීම හා නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීම යන ක්‍රමවලින් සිදු කෙරිණි. ද්විතියික දත්ත ලබා ගැනීම සඳහා මීට පෙර කරන ලද අධ්‍යයනයන්, අදාළ පනත්, පාර්ලිමේන්තු විවාද වැනි වාර්තා මෙන් ම මුද්‍රිත වාර්තා ද පරිශීලනය කරන ලදී.

වර්තමානයේ අද භුක්ති ක්‍රමය වැඩි වශයෙන් ක්‍රියාත්මක වන හා අද ගොවි ගැටළු වැඩිපුර ම වාර්තා වන දිස්ත්‍රික්ක 03 ක් (හම්බන්තොට, මාතර, අනුරාධපුරය) තෝරා ගෙන ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. එහි දී තෝරාගත් දිස්ත්‍රික්ක තුළ වැඩි ම අද ගොවීන් ප්‍රමාණයක් සිටින ගොවිජන සංවර්ධන බල ප්‍රදේශ 02 බැගින් තෝරා ගැනිණි. ඉන්පසු එම එක් එක් ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයකින් අද ගොවි ගැටළු වැඩි වශයෙන් පවතින කෘෂිකර්ම පර්යේෂණ හා

නිෂ්පාදන සහකාර (කෘ. ප. නි. ස) කොට්ඨාස 02 බැගින් තෝරා ගැනිණි. එම එක් එක් කෘ. ප. නි. ස කොට්ඨාසයක් තුළ සිටින අද ගොවින් හා ඉඩම් හිමියන් 50-60 අතර සංඛ්‍යාවක් රැස්කර, ඔවුන් සමග 2010 යෝජිත පනත් කෙටුම්පත පිළිබඳ ව කණ්ඩායම් සාකච්ඡා පවත්වා අදහස් ලබා ගන්නා ලදී.

ඊට අමතර ව මෙම එක් එක් ගොවිජන සේවා බල ප්‍රදේශයේ සිටින ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගෙන් (ගොවිජන කොමසාරිස්වරුන්, ගොවිජන සංවර්ධන නිලධාරීන් හා කෘ.ප.නි.ස. වරුන්) යෝජිත පනත පිළිබඳ ව අදහස් හා යෝජනා ලබා ගන්නා ලදී.

## 4. අද ගොවින් ලේඛනගත කිරීම හා විවිධ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක අද ගොවි ක්‍රම

### 4.1 ලේඛනගත අද ගොවින්

අද ගොවියා යනු, "වෙනත් පුද්ගලයකු සතු කුඹුරක් තම ශ්‍රමය සහ ධනය වැය කොට වගා කර ලබන මුළු අස්වැන්නෙන් කොටසක් ලබා ගන්නා තැනැත්තා" වශයෙන් හැඳින්විය හැකි ය. මෙය ශ්‍රී ලංකාවේ ඈත අතීතයේ සිට පැවත ආ සාම්ප්‍රදායික අද ගොවිතැන් ක්‍රමය යි. පසු කාලයේ දී අද ගොවිතැන ව්‍යාප්ත වීමෙන් අද ගොවින් විශාල සංඛ්‍යාවක් ගොවිජන සමාජයේ සිටි බැවින් හා ඔවුන් විවිධ අසාධාරණවලට ලක්වීම නිසා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අවධානයට ද යොමු විය. එම නිසා 1950 දශකයේ සිට අද ගොවිතැන නීති රාමුවකට යටත් රැකියාවක් බවට පත් කර, ඒ සම්බන්ධයෙන් නීති සම්මත කිරීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාවේ අද ගොවිතැන නව මාවතකට යොමු කරන ලද්දේ 1958 අංක 01 දරණ කුඹුරු පනත මගිනි. 1958 අංක 1 දරණ කුඹුරු පනතින් අද ගොවියා යන්න මෙසේ නිර්වචනය කර ඇත.

> "යම් කුඹුරු ප්‍රමාණයක් සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයෙ හි මේ පනත වලංගු වීමට පෙර හෝ පසුව යම් වාචික හෝ ලිඛිත ගිවිසුමක් යටතේ බදු ගත් යම් තැනැත්තෙක් ඒ කුඹුරු ප්‍රමාණයෙ හි ගොවියා වී සිටී ද ඔහු ලංකාවේ රටවැසියෙකු නම්, ඔහු ඒ කුඹුරු ප්‍රමාණයේ අද ගොවියා වන්නේ ය" (1958 අංක 01 දරණ කුඹුරු පනත).

ලිඛිත හෝ වාචික ගිවිසුමක් යටතේ, වී ගොවිතැනෙ හි නියැළෙන, වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත සම්මත වීමට පෙර සිට කුඹුරු නාම ලේඛනයේ ලේඛනගත වී සිටින අද ගොවින් "ලේඛණගත අද ගොවින්" නමින් හැඳින්වේ.

### 4.2 ලේඛනගත අද ගොවියකු බවට පත්වීමේ ක්‍රමවේදය

සෑම ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයක ම කුඹුරු නාම ලේඛනය නමින් වූ ලේඛනයක් පවත්වාගෙන යයි. 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත සම්මත වීමට පෙර පැවති ක්‍රමය වූයේ, ලිඛිත හෝ වාචික ගිවිසුමක් මත අලුත් අද ගොවියකු පත් කරගැනීමට අවශ්‍ය නම් අදාළ ගොවිජන සංවර්ධන සභාවෙන් අයදුම්පත්‍රයක් ලබාගෙන නිසි පරිදි පුරවා අයදුම් කිරීම යි. එම අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා වසරකට අවස්ථාවන් දෙකක් ලබා දී ඇත. එනම් ජනවාරි සහ ජූලි යන මාස දෙකේ දී ය. ජනවාරි 31 දින සිට පෙබරවාරි 15 වන දින දක්වාත්, ජූලි මස 31 දින සිට අගෝස්තු මස 15 වන දින දක්වාත් මෙම ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කර ආපසු බාරදිය යුතු වේ. ඉන් පසු ගොවිජන සංවර්ධන කමිටුව මගින් ඉඩම් අයිතිකරු හා අදගොවියා කැඳවා අවශ්‍ය ඔප්පු සහ වෙනත් අවශ්‍ය ලියකියවිලි පරීක්ෂා කර බලා, ඒවා නියමිත පරිදි ඇත්නම් ගොවිජන

සංවර්ධන මධ්‍යස්ථානයේ එම ලේඛන ප්‍රදර්ශනය කරයි. විරෝධතා ඇතොත් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙයි. විරෝධතාවයන් නොමැති ව සියල්ල නිසි පරිදි නිවැරදි ව ඇත්නම් එය අද කුඹුරක් ලෙස කුඹුරු නාම ලේඛනයේ ලියාපදිංචි කිරීමට නිර්දේශ කරයි.

කුඹුරු නාම ලේඛනය තොරතුරු කීපයකින් සමන්විත ය. එම කොටස් පහත සඳහන් පරිදි දැක්විය හැකි ය. ඉඩමේ අනු අංකය, ඉඩමේ නම, ඉඩමේ ප්‍රමාණය (අක්කර, රූඩ්, පර්චස්) ඉඩම් හිමියාගේ නම, ඉඩම් හිමි ගොවියාගේ නම හා අද ගොවියකු සිටී නම් අද ගොවියාගේ නම යන විස්තර යි.

අද ගොවින් මියයාම, කුඹුරුහිමියන් ඉඩම් විකිණීම වැනි වෙනස්කම් කල්යාමේ දී සිදු වේ. එවැනි කලින් කල සිදුවන වෙනස්කම්වලට අනුකූල ව සංශෝධනවලට ඉඩදීම සඳහා පෙර සඳහන් කළ පරිදි කුඹුරු නාම ලේඛනය වසරකට දෙවතාවක් (ජනවාරි සහ ජූලි) අලුත් කිරීමට ඉඩකඩ ලබා දී ඇත. 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 53 (3) වගන්තිය අනුව ඉඩම් හිමියාගේ ලිඛිත කැමැත්ත මත අලුත් අද ගොවියකු ලේඛනගත කළ හැක.

සාමාන්‍යයෙන් ඉඩම් හිමියකුට කුඹුර තනියම වගාකර ගැනීමට නො හැකි අවස්ථාවල දී ඒ සඳහා හැකියාව ඇති වෙනත් ගොවියකුට වගා කිරීමට පවරා වගා කිරීමේ වියදම ද අස්වැන්න ද දෙදෙනා අතර බෙදා ගනී. මෙය රටෙ හි කාලයක් ක්‍රියාත්මක වූ එමෙන් ම නීතියට පිටස්තර ව දැනටත් ක්‍රියාත්මක අද ක්‍රමයකි. මෙම ක්‍රමය ලේඛනගත අද භුක්ති ක්‍රමයක් ලෙස නො සැලකේ. මෙම අධ්‍යයනයේ දී සලකා බැලෙන්නේ මෙම සාමාන්‍ය අද ක්‍රමය නොව, පෙර දී විස්තර කළ ලේඛනගත අද ගොවි ක්‍රමය යි. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුව වර්තමානයේ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ලේඛනගත අද ක්‍රම විවිධ නම්වලින් හැඳින්වෙන අතර, ප්‍රවේණිය ගෙවීම ද විවිධ ය. දිස්ත්‍රික්ක කීපයක වර්තමානයේ ක්‍රියාත්මක අදක්‍රම පිළිබඳ පහතින් විස්තර කෙරේ.

## 4.3 වර්තමාන අද ගොවි ක්‍රම

හම්බන්තොට, මාතර, මහනුවර, කෑගල්ල, අනුරාධපුර, කුරුණෑගල යන ප්‍රදේශවල ලේඛනගත අද ක්‍රමය ක්‍රියාත්මක වේ. නමුත් ගොවි ජනපද වැඩි ප්‍රමාණයක් පවතින පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ලේඛනගත අද ක්‍රමය ක්‍රියාත්මක වීම ඉතාම අඩු මට්ටමක පවතින බව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු වාර්තා අනුව පෙනේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් බකමූණ ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ ඉතා සුළු වශයෙන් ලේඛනගත අද ක්‍රමය ක්‍රියාත්මක වේ. නීත්‍යානුකූල අද ගොවි ක්‍රමය යටතේ එක් එක් දිස්ත්‍රික්කවල ප්‍රවේණිය ගෙවීම් ක්‍රම වගු අංක 1 න් ඉදිරිපත් කර ඇත.

**වගු අංක 1**

**නීත්‍යානුකූල අද ගොවි ක්‍රමය යටතේ එක් එක් දිස්ත්‍රික්කවල ප්‍රවේණිය ගෙවීමේ ක්‍රම**

| දිස්ත්‍රික්කය | ප්‍රවේණිය ගෙවීමේ ක්‍රමය |
|---|---|
| හම්බන්තොට | මහා වාරිමාර්ග අක්කරයට බුසල් 14, වර්ෂාපෝෂිත අක්කරයට බුසල් 12 |
| මාතර | අක්කරයට බුසල් 12,13,14 හෝ මුළු අස්වැන්නෙන් නියමිත අඩු කිරීම් අඩු කර ඉතිරියෙන් 1/4 |

| | |
|---|---|
| මහනුවර | අක්කරයට බුසල් 13,14 ක් හෝ මුළු අස්වැන්නෙන් නියමිත අඩු කිරීම් අඩු කර පසු ඉතිරියෙන් 1/4 හෝ යන දෙකෙන් වැඩි කොටස |
| කෑගල්ල | අක්කරයට බුසල් 10කට නොඅඩු ප්‍රමාණයක් හෝ මුළු අස්වැන්නෙන් නියමිත අඩු කිරීම් අඩුකර ඉතිරියෙන් 1/4 කට නොඅඩු කොටසක් හෝ යන මේ දෙකෙන් වැඩි කොටස |
| අනුරාධපුරය | මහාවාරිමාර්ග අක්කරයට වී බුසල් 14,15, වර්ෂාපෝෂිත අක්කරයට වී බුසල් 12 නියමිත අඩු කිරීම් අඩුකර ඉතිරි මුළු අස්වැන්නෙන් 1/4 මුදලට කුඹුරු බද්දට දීමේ ක්‍රමය ක්‍රියාත්මක වේ. |
| කුරුණෑගල | මුළු අස්වැන්නෙන් 1/4 |

මූලාශ්‍රය : ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල වාර්තා, (2010).

වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත සම්මත වීමෙන් පසු අලුතින් අඳ ගොවීන් බිහි නො වීමේ තත්ත්වය මත මෙතෙක් අඛණ්ඩ ව සුරක්ෂිත ව පැවති අඳ ගොවිතැන ගැටළු රාශියකට මුහුණපා ඇත. එම ගැටළු හඳුනා ගැනීමත්, ඒවාට පිළියම් ලෙස නව අඳ ගොවි පනත සකස් විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳවත්, ගොවිජන සමාජයේ අදහස් ඉදිරිපත් කිරීමත් මීළඟ කොටස මඟින් සිදු කරනු ලැබේ.

## 5. 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත නිසා ගොවිජන ක්ෂේත්‍රයේ උද්ගත වී ඇති ගැටළු

### 5.1 අඳ ගොවීන් මුහුණපාන ගැටළු

වර්ෂ 2000 පනත අනුව, ජීවත් ව සිටින අඳ ගොවියාගෙන් පසු අනුප්‍රාප්තිකයකු නම් කිරීමට අවස්ථාවක් නොමැති නිසා, මියගිය අඳ ගොවීන්ගේ හිමිකම් පැවරීම සම්බන්ධ ව අඳ ගොවියාගේ දරුවන් හා ඉඩම් හිමියන් අතර ආරවුල් හට ගැනීම අඳ ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නයකි. එසේ ම පවතින පනත අනුව එහි ඇති නීතිමය තත්ත්වය ප්‍රයෝජනයට ගනිමින් අඳ ගොවියා මිය ගිය පසු ඉඩම් හිමියා බලෙන් කුඹුරු ඉඩමට ඇතුල් වී වගා කටයුතු කිරීමත්, ඉඩම් හිමියාගේ කැමැත්තකින් තොර ව වෙනත් පුද්ගලයකු ලවා වගා කරවා ගැනීමට අවස්ථාවක් තො තිබීමත් නිසා අඳ ගොවීහු විශාල වශයෙන් ප්‍රශ්නවලට මුහුණ පා සිටිති. පනත අනුව, අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට ගෙවනු ලැබිය යුතු බද්ද ලෙස මුළු අස්වැන්නෙන් 1/4 හෝ අක්කරයට බුසල් 10 හෝ යන දෙකෙන් වැඩි කොටස ගෙවිය යුතු බව සඳහන් වීම නිසා 1/4 ක් ගෙවීමට බොහෝ අඳ ගොවීන්ට සිදු වී තිබේ. මේ අනුව බොහෝ ප්‍රදේශවල ඉඩම් හිමියන් අස්වැන්නෙන් 1/4 ක් ප්‍රවේණිය ලෙස ගෙවන ලෙස අඳ ගොවියාට බල කිරීම නිසා ගැටුම්සහගත තත්ත්වයක් මතු වී තිබේ. මෙම හේතුව නිසා අඳ ගොවියා හා ඉඩම් හිමියා අතර පෙර පැවති සුහදත්වය පළුදු වීමක් වර්තමානයේ දැකිය හැක.

වර්ෂ 2000 ගොවිජන සංවර්ධන පනත අනුව, අඳ ගොවියකු අඳ අයිතියෙන් පහ කළ පසු ඒ සඳහා පැමිණිලි කිරීමට ලබා දී ඇති කාල සීමාව මාස 6 කි. මීට පෙර පැවති පනත්වල ඒ සඳහා වසර 5 ක කාල සීමාවක් ලබා දී තිබුණි. මෙසේ කාල සීමාව කෙටි කිරීම මඟින් අඳ ගොවීන්ට අසාධාරණයක් සිදු වී තිබේ.

තව ද මෙම පනත අනුව අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට ගෙවිය යුතු ප්‍රවේණි බද්ද වන අස්වැන්න කමතේ දී ම හෝ දින 15 ක් ඇතුළත ගෙවීමට නියම කිරීම නිසා කලින් පනත්වල පැවති දින 30 කාල සීමාව අහෝසි වේ. මෙහි දී අඳ ගොවීන් පවසන්නේ තමන්ට මෙම පනත මඟින් ලබා දී ඇති කාල සීමාව ප්‍රමාණවත් නො වන බව යි. වී වලින් ගෙවන්නේ නම් ගැටළුවක් නොමැති අතර, මුදලින් ප්‍රවේණිය ගෙවීමේ දී ගැටළුවකට මුහුණ පෑමට සිදු වේ. අඳ ගොවියාට නියමිත දින 15 කාල සීමාව තුළ සාධාරණ ඉහළ මිලකට තම අස්වැන්න විකුණා ගැනීමට නො හැකි වුව හොත් ඉඩම් හිමියාට ඉහළ මිලක් යටතේ වැඩි ආදායමක් ගෙවීමට නො හැකි වේ. මෙම කාලයේ දී අස්වනු කැපීම බහුල නිසා වී මිල පහළ යාම නිරන්තර ව සිදු වන අතර, මෙම කාලය තුළ ඉහළ මිලක් ලබා ගැනීමට නො හැකි වීමෙන් අඳ ගොවියාට මෙන් ම ඉඩම් හිමියාට විශාල අසාධාරණයක් සිදු වේ. ඒ නිසා ප්‍රවේණිය ගෙවීම සඳහා අඳ ගොවියාට සහනදායී කාලයක් ලබා දීම අඳ ගොවියා හා ඉඩම් හිමියා යන දෙපාර්ශ්වයට ම වාසි සහගත වේ.

## 5.2 ඉඩම් හිමියන් මුහුණපාන ගැටළු

ඉඩමේ අයිතිකරු වන ඉඩම් හිමියාට තම ඉඩමේ වටිනාකම වෙනුවෙන් ලැබිය යුතු ප්‍රවේණි බද්ද නිසි පරිදි නො ලැබෙන බවට බොහෝ ඉඩම් හිමියෝ මැසිවිලි නගති. පනතට අනුව අක්කරයට බුසල් දහයකට නොඅඩු ප්‍රමාණය හෝ මුළු අස්වැන්නෙන් 1/4 යන මේ දෙකෙන් වැඩි කොටස ප්‍රවේණිය ලෙස ගෙවිය යුතු වුවත්, බොහෝ ඉඩම් හිමියන්ට ලැබෙන්නේ අඩු කොටසකි. මෙම ප්‍රවේණිය ද වී වලින් ලැබෙන විට එය බොල් වී, ඇඟිටි ඇතුළු අපිරිසිදු වීවලින් ලැබේ. මෙම හේතුව නිසා අඳ ගොවියා හා ඉඩම් හිමියා අතර නිරන්තර ආරවුල් වාර්තා වේ. තව ද අඳ ගොවීන් පෙර සිට ම නීත්‍යානුකූල ව සිටීම නිසා ඇතැම් කුඹුරු හිමියන්ට කුඹුර තමාට ම වගා කිරීමේ අවස්ථාව නො ලැබී යයි. ඇතැම් ඉඩම් හිමියන්ට තිබෙන එක ම ආදායම් මාර්ගය ද එම කුඹුර පමණක් වෙයි. එවැනි අවස්ථාවල දී ඉඩම් හිමියාට වගා කිරීමට අවස්ථාව නො ලැබීමෙන් ඔහුට ප්‍රවේණිය ලෙස ලැබෙන ප්‍රමාණය ජීවත්වීම සඳහා ප්‍රමාණවත් නො වීමෙන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වේ. එසේ ම ඉඩම් හිමියාට හෝ ඔහුගේ පවුලේ අයකුට යම් අසනීප අවස්ථාවක දී එම කුඹුරක් විකුණා මුදල් ලබා ගැනීමට අවශ්‍ය වුව හොත් එසේ කිරීමට නො හැකි නිසාත්, ඒ සඳහා දිගු කාලයක් ගත වීම නිසාත්, එසේ ම අඳ ගොවියකු සිටින කුඹුරක් ඒ කුඹුරේ නියමිත වටිනාකමට වඩා අඩුවෙන් විකිණීමට සිදුවීමත් ඉඩම් හිමියන් මුහුණ පාන ගැටළු වේ. කුඹුරු නාම ලේඛන සංශෝධනය නො වීම නිසා පෙර සිටි ඉඩම් හිමියන්ගේ නාම ලේඛනය ම වර්තමානයේ දී ද පැවතීම නිසා එම ඉඩම් හිමියන්ගේ දූ දරුවන්ට හෝ කලත්‍රයාට ඉඩම් හිමියන් ලෙස පෙනී සිටීමට නො හැකි වීමෙන් ප්‍රවේණිය ලබා ගැනීමේ දී දුෂ්කරතා මතු වේ. මෙයට හේතුව එම අලුත් ඉඩම් හිමියන්ගේ නම් ලේඛනයේ නොමැති නිසා අඳ ගොවීන් ප්‍රවේණිය ගෙවීම ප්‍රතික්ෂේප කිරීම යි. එසේ ම ජලය හිඟ කන්නවල දී වෙනත් කෙටි කාලීන බෝග යෙදීමට වැඩපිළිවෙළක් නො තිබීමත්, අඳ ගොවීන් ඒ සඳහා උනන්දුවක් නො දැක්වීමක් නිසා ඉඩම් හිමියන්ට අසාධාරණයක් හා අලාභයක් සිදු වේ. තව ද ආපදා අවස්ථාවල දී කුඹුර පාළුවීම වෙනුවෙන් ප්‍රවේණිය අඩුකර ගෙවීමට කොමසාරිස් විසින් අඳ ගොවීන්ට ලබා දී ඇති සහනය අඳ ගොවීන් අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීමත්, එවැනි පාළු වූ කුඹුරු සඳහා තක්සේරුවක් කිරීමට නිසි පුහුණුවක් කෘ.ප.නි.ස.වරුන්ට හෝ ප්‍රාදේශීය නිලධාරීන්ට නොමැති වීමත් නිසා ඉඩම් හිමියාට අසාධාරණයක් සිදු වේ.

## 5.3 පොදු ගැටළු

වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ නීතිවලට අනුව මේ දක්වා ම කෘෂි විනිශ්ච සභා පිහිටුවා නො තිබීමත්, ඒ සඳහා පරීක්ෂණ නිලධාරීන් පත්කර නො තිබීමත් විශාල අඩුපාඩුවක් වන අතර, ඒ නිසා 2000 සිට ම අභියාචනා හා පැමිණිලි විශාල වශයෙන් ඒකරාශී

වී තිබේ. මෙය ඉඩම් හිමියන් හා අඳ ගොවීන් යන දෙපාර්ශවයටම බරපතල ප්‍රශ්නයකි. පනතෙහි මේ සඳහා විශ්‍රාමලත් විනිසුරුවන්ගෙන්, ජ්‍යෙෂ්ඨ නීතිඥයන්ගෙන් හා වසර 7 ක කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති නිලධාරීන්ගෙන් සමන්විත විනිශ්චය අධිකාරියක් පත් කළ යුතු බව සඳහන් වේ. නමුත් මෙවැනි නිලධාරීහු අධික වැටුපක් නොමැතිව මෙම සේවාවන් සඳහා නො පැමිණෙති. මේ දක්වා අදාළ විනිශ්චය අධිකාරිය ආරම්භ වී නොමැත. මෙය ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ඉඩම් හිමියන්ගේ ප්‍රවේණි පරීක්ෂණ දිගින් දිගට ම නො පවත්වා සිටීමට හේතු වූ ප්‍රබල කරුණක් වෙයි.

## 6. අඳ ගොවි පනතේ සංශෝධනය විය යුතු වගන්ති පිළිබඳ අඳ ගොවීන්, ඉඩම් හිමියන් , නිලධාරීන්ගේ අදහස් සහ යෝජනා

### 6.1 උපරිම කුඹුරු ප්‍රමාණය තීරණය කිරීම

වර්ෂ 1958 සිට අඳ ගොවීන් සතු ව පැවති උපරිම කුඹුරු වපසරිය අක්කර 5 කි. 1979, 1991, 2000 යන පනත්වලින් ද මෙම සීමාව එලෙස ම පවත්වාගෙන ගොස් තිබේ. මේ නිසා තවදුරටත් සීමාව එලෙස ම තැබිය යුතු බවට අඳ ගොවීන් සියළුදෙනාත්, ඉඩම් හිමියන් බොහෝ දෙනෙකුත්, නිලධාරීන් බහුතරයකුත් ප්‍රකාශ කළහ. අක්කර 2 1/2 ක් දක්වා උපරිම සීමාව අඩු කළ හොත් මෙතෙක් පවත්වාගෙන ආ ආර්ථික තත්ත්වය බරපතල ලෙස කඩාවැටීමකට ලක්වන බව අඳ ගොවීන් විසින් ප්‍රකාශ කරන ලදී. ඉඩම් හිමියන් බොහෝ දෙනෙක් ප්‍රදේශයෙන් බැහැර ව සිටීම නිසා අඳ ගොවියාගේ අයිතිය අක්කර 2 1/2 කට සීමා කර, ඉතිරි ප්‍රමාණය කුඹුරු හිමියාට ලබා දී කුඹුරු හිමි ගොවියෙකු ලෙස වගා කිරීමට ලබා දුන හොත්, නව අඳ ගොවියෙකු බිහිවන අතර, මෙය ඉඩම් කැබලි වීම වැඩිවීමටත්, ජාතික නිෂ්පාදනය අඩුවීමටත් හේතු වේ. මෙහි දී දැනට පවතින උපරිමය වන අක්කර 5 තව දුරටත් නො බෙදා තැබිය යුතු බවට ඉඩම් හිමියෝ ද ප්‍රකාශ කළහ.

### 6.2 අඳ ගොවියාගේ අයිතිවාසිකම්වලට අනුප්‍රාප්තිකයෙකු නම් කිරීම

වර්ෂ 1958 අංක 01 දරණ කුඹුරු පනත අනුව, අඳ ගොවියා මියගිය පසු ඔහුගේ අයිතිවාසිකම් සඳහා ලංකාවේ පුරවැසියෙකු නම් කිරීමට අඳ ගොවියාට හැකියාව තිබිණි. එසේ ම එම අඳ ගොවියාට ඉහත කී නම් කිරීම අවශ්‍ය ඕනෑ ම විටක අවලංගු කර, ඒ සඳහා අලුතින් කෙනකු නම් කිරීමට ද බලතල තිබිණි.

වර්ෂ 1979 අංක 58 දරණ ගොවිජන සේවා පනත අනුව, යම් අඳ ගොවියකු සමඟ හවුලේ හෝ තට්ටු මාරුවට වගා කරන අඳ ගොවියකු හැර, සෙසු අඳ ගොවියකු සතු අයිතිවාසිකම්වලට ඔහුගේ මරණින් පසු අනුප්‍රාප්තිකයෙකු ලෙස පවුලේ සාමාජිකයෙකු නම් කිරීමට අඳ ගොවියාට හැකියාව තිබිණි.

වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත ඉදිරිපත් කරන ලද්දේ, අඳ ගොවියා හෝ ඉඩම් හිමියා යන පාර්ශව දෙකෙන් එක් පාර්ශවයක් විසින් කුඹුරු ඉඩම මිලට ගනු ලැබීමේ පසුබිමක් නිර්මාණය කිරීමේ අරමුණෙනි. එම නිසා 2000 පනත අනුව අනුප්‍රාප්තිකයකුට උරුම වීමක් පිළිබඳ ව දක්වා නැත.

අඳ ගොවියා මියගිය හොත් හෝ පූර්ණ බෙලහීන තත්ත්වයට පත් වුව හොත්, කලත්‍රයාටත්, ඉන්පසු දරුවකුටත් අනුප්‍රාප්තිකයා ලෙස කුඹුර වගා කිරීමට අයිතිවාසිකම් තිබිය යුතු ය. නමුත් මෙම දෙවන පැවරුම කිරීමේ දී අදාළ අඳ ගොවියා හා ඉඩම් හිමියා අතර වගකීම් සහිත

ගිවිසුමක් අත්සන් කළ යුතු ය. එහි දී අදාළ අනුප්‍රාප්තිකයා අනිවාර්යයෙන් ම ගොවිතැන් කටයුතුවල යෙදෙන්නකු විය යුතු බවත්, වගකීමෙන් වගා කටයුතු සිදු කරන බවට විශ්වාසයක් මෙම ගිවිසුම මඟින් දෙපාර්ශ්වය අතර ඇති විය යුතු ය යන්නත් අද ගොවීන්ගේ හා ඉඩම් හිමියන්ගේ අදහස විය. නිලධාරීහු ද මෙයට එකඟත්වය පළ කළහ. එසේ ම හම්බන්තොට සහ මාතර යන දිස්ත්‍රික්කවල ඉඩම් හිමියන් ප්‍රකාශ කළ පරිදි, නීත්‍යානුකූල අද ගොවියාගෙන් පසුව දරුවන්ට අදය උරුම වීමේ දී ඉඩම් හිමියන්ගේ කැමැත්ත ද සලකා බැලිය යුතු ය. දෙවැනි අද ගොවියකුට අද අයිතිය උරුම වීමේ දී ඔහු සැබෑ ගොවියකු ද, එසේ ම උනන්දුවෙන් සහ ළෙන්ගතුකමකින් අද කුඹුර වගාකර උපරිම අස්වනු නෙලාගැනීමට කටයුතු කරන්නෙක් ද යන්න සොයා බැලිය යුතු අතර, එවැනි ප්‍රායෝගික ගොවියකු නම් ඔහුත් සමඟ යළිත් ලිඛිත හෝ වාචික ගිවිසුමක් ඇතිකර ගැනීමට අවස්ථාව තිබිය යුතු ය.

## 6.3 අද ගොවියාගේ අයිතිවාසිකම් උරුම කිරීමට අනුප්‍රාප්තිකයෙකු නම් නො කළ විට

වර්ෂ 1958 අංක 1 දරණ කුඹුරු පනත අනුව, අනුප්‍රාප්තිකයකු නොමැති ව අද ගොවියා මියගිය පසු ජීවත් ව සිටින කලත්‍රයාට ද එවැන්නකු නොමැති විට අදාළ අද ගොවියාගේ ලේ ඥාතියකුට ද (වැඩිමහල් ඥාතිවරයාට) අද ගොවිතැන උරුම වේ. එසේ ම අද අයිතිවාසිකම් උරුම වන තැනැත්තා ගොවිතැන නුපුරුදු තැනැත්තෙක් නම්, ප්‍රදේශයේ ගොවිකාරක සභාව විසින් මිය ගිය අයගේ ගොවිතැන පුරුදු ඥාතිවරයකු තෝරා අද අයිතියේ උරුමකරු වශයෙන් ඔහු පත් කළ යුතු ය. අද ගොවියා මියගිය පසු අද අයිතිය උරුම වීමට බිරිඳක, සැමියකු, ඥාතියකු හෝ පත් වීමට නම් කරන ලද්දකු නැති විට, ගොවිකාරක සභාව විසින් එය ඉඩම් හිමියා වෙත ලිපියකින් දැන්විය යුතු ය. ඉන්පසු ඉඩම් හිමියා විසින් ඉඩම් හිමි ගොවියා වීමට කැමති බව දන්වා සිටිනු ලැබුව හොත්, අක්කර 5 කට නොවැඩි කොටසක ඉඩම් හිමි ගොවියකු වීමට කාරක සභාව විසින් ඔහුට අවසර දෙනු ලැබේ. මේ සඳහා දින 30 ක කාලයක් ඉඩම් හිමියාට දෙනු ලබන අතර, ඉඩම් හිමියා එම නියමිත කාල සීමාව තුළ දැනුම් දීමක් නො කළ හොත්, කාරක සභාව විසින් එම අයිතිවාසිකම් සඳහා සුදුසු තැනැත්තෙක් නම් කරනු ලැබිය යුතු ය. එම තැනැත්තා, "අදාළ ප්‍රදේශයේ වසන්නකු වීම වඩාත් සුදුසු"ය යන්නෙන් දක්වා ඇත.

වර්ෂ 1979 අංක 58 දරණ ගොවිජන සේවා පනත අනුව, අද ගොවියා අනුප්‍රාප්තිකයකු නම් නො කර මියගිය විට ඔහු සතු අයිතිවාසිකම් ජීවත් වන ඔහුගේ බිරිඳට ද එවැන්නකු නැති විට දරුවකුට ද එම අද ගොවියාට දරුවන් එක් අයකුට වඩා සිටින විට ඔවුන් අතරින් වැඩිමලාට ද, දරුවන් නොමැති විට ඒ අද ගොවියාගේ දෙමව්පියකු, සහෝදරයකු හෝ සහෝදරියක වෙත ද උරුම වේ.

වර්ෂ 2000 පනතේ අනුප්‍රාප්තිකයකු පිළිබඳ ව සඳහනක් නැත.

අද ගොවියා මියගිය පසු, කලත්‍රයා හෝ දරුවන් නොමැති විට අද ගොවියාගේ හා ඉඩම් හිමියාගේ කැමැත්ත මත අනුප්‍රාප්තිකයකු නම් කිරීමට එම අද ගොවියා ජීවත් ව සිටින කාලයේ දී ම ඔහුට හැකියාව තිබිය යුතු ය. නීත්‍යානුකූල අද ගොවියාට නීත්‍යානුකූල දරුවන් නොමැති තත්ත්වයක් යටතේ ඔහු පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ පසු අද කුඹුර වගා කිරීම ඥාතියකුට හෝ වෙනත් හිතෛෂී පුද්ගලයකුට පැවරීම ක්ෂේත්‍රයේ සිදුවන ප්‍රායෝගික තත්ත්වය යි. අද ගොවියා කුඹුර තම ඥාතියකුට පැවරීම මඟින් බලාපොරොත්තු වනුයේ, තම අවසාන කාලය සඳහා රක්ෂාවරණයක් සලසා ගැනීම යි. එවැනි අවස්ථාවක දී අද කුඹුරක් බාර ගන්නා තැනැත්තා ද අනාගත අද උරුමයක් සඳහා බලාපොරොත්තු තබා ගන්නා අවස්ථා ඇත. මේ නිසා අද ගොවියාට නීත්‍යානුකූල දරුවන් නො සිටිය හොත් හෝ කලත්‍රයා ජීවත්ව නො සිටිය හොත්

එම අඳ ගොවියා, අබලදුබල අවස්ථාවේ රැකබලා ගෙන ගොවිතැන් කරන යම් ඥාතියකුට හෝ වෙනත් පුද්ගලයකුට අඳ ගොවියා මියගිය පසු අඳ අයිතිය අයත් වන සේ වගන්තියක් පනත තුළ යෙදිය යුතු ය.

## 6.4 අඳ ඉඩම ඉඩම් හිමියා විසින් විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබීම

වර්ෂ 1958 පනතෙ හි ඉඩම විකිණීම පිළිබඳ ව සඳහන් නො වන නමුත් ඉඩම් හිමියා අදාළ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමි ගොවියකු වීමට අදහස් කරන විට පනත වලංගු වීම ආරම්භ වී 5 ක් වසරක් ඇතුළත ඒ බව අදාළ ප්‍රදේශයේ ගොවිකාරක සභාවට ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. එහි දී අදාළ අඳ ගොවියාට අයවිය යුතු යම් වන්දි මුදලක් වෙතොත්, එය ගෙවීවාට පසු නියමිත කුඹුරු ප්‍රමාණයෙන් ඉවත් වීමට ලිඛිත විධානයක් කළ යුතු ය.

වර්ෂ 2000 පනතට අනුව, ඉඩම් හිමියා විසින් මුලින් ම තම ඉඩම විකිණීමට අදහස් කරන මිල ද සඳහන් කර ලිඛිත ව අඳ ගොවියාට දැනුම් දෙනු ලැබිය යුතු ය. ඊට හේතුව, මෙම පනත නිර්මාණය කරන ලද්දේ අඳ ගොවියා හෝ ඉඩම් හිමි ගොවියා යන දෙදෙනාගෙන් එක් අයෙකුට අඳ කුඹුර මිල දී ගැනීමට අවස්ථාව සලසා දීම සඳහා වීම යි. නමුත් යෝජිත ඉඩම් බැංකු ක්‍රමය ක්‍රියාත්මක නො වීම නිසා ප්‍රායෝගික ව මෙම අදහස ක්‍රියාත්මක වීමක් සිදු නොවේ.

කුඹුරු හිමියන්ට තම පෞද්ගලික දේපළ වන කුඹුරු, අවශ්‍ය අවස්ථාවක දී වෙනත් අයෙකුට විකිණීමට හැකි වන සේ නීතිරීති සකස් විය යුතු බව ඉඩම් හිමියන්ගේ අදහස යි. අසනීපයක් වැනි හදිසි අවස්ථාවක දී ඉතා කෙටි ක්‍රමයකින් ඉඩම විකිණීමට ඉඩම් හිමියාට අවස්ථාව තිබිය යුතු ය. අඳ ගොවියකු ද සමග ඉඩමක් උපරිම මිලකට විවෘත වෙළෙඳපළේ විකිණීම අසීරු කරුණකි. එම නිසා මෙම වාතාවරණය තුළ හැකි උපරිම මිලකට ඉඩම විකිණීමට ඉඩම් හිමියාට ඉඩකඩක් පනත තුළින් ලබා දීම කාලෝචිත ය.

ඉඩම අඳ ගොවියා විසින් මිලට ගනු ලබන්නේ නම්, "ඉඩමේ අඳ අයිතිවාසිකමට අදාළ වටිනාකම අඩු විය යුතු ය" යන්නත්, "එලෙස අඩු මිලට මිල දී ගැනීමට අවශ්‍ය පහසුව සලසන නීතියක් ඇතුළත් විය යුතු ය" යන්නත් අඳ ගොවීන්ගේ අදහස විය. ඉඩම මිල දී ගැනීමට අපහසු පුද්ගලයකුට ඉඩම් බැංකුවක් පිහිටුවා (පහසු පොලියක් යටතේ) ණය පහසුකම් ලබා දිය යුතු ය. ඉඩම් හිමියා සහ අඳ ගොවියා අතර ඉඩම විකිණීම පිළිබඳ සංවාදය නියමිත පරිදි සිදු විය යුතු ය. මෙවැනි ඉඩම් විකිණීම පිළිබඳ පරීක්ෂණ කඩිනම් කිරීමට කමිටුව ක්‍රියා කළ යුතු ය. නිලධාරීන්ගේ අදහස වූයේ, කුඹුරු හිමියා හෝ අඳ ගොවියා යන දෙදෙනාගෙන් එක් අයකු විසින් කුඹුර සාධාරණ මිලකට (කාරක සභාව තීරණය කරන) මිල දී ගනු ලැබිය යුතු බව යි. එවිට ආරවුල් ඇති නොවේ. එසේ නැත හොත් අයිතිය නිශ්චිත වන සේ කුඹුරු හිමියා හා අඳ ගොවියා විසින් කුඹුර බෙදා ගනු ලැබිය යුතු ය.

## 6.5 අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට ගෙවිය යුතු ප්‍රවේණිය තීරණය කරනු ලැබීම

1958 - එක් එක් කුඹුරු අක්කරයකින් වී බුසල් 15 කට නොවැඩි ගණනක් හෝ මුළු අස්වැන්නෙන් 1/4 කට නොවැඩි කොටසක් යන දෙකින් අඩු ප්‍රමාණය එක් කන්නයක් සඳහා බද්ද ලෙස ගෙවිය යුතු ය. මෙම නිශ්චය කෙරෙන බද්ද විවිධ පරිපාලන දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් හෝ එක ම පරිපාලන දිස්ත්‍රික්කයේ විවිධ කොටස් සම්බන්ධයෙන් හෝ වෙනස් විය හැක.

1979 - එක් එක් අක්කරයකින් වී බුසල් 15 කට නොවැඩි ගණනක් හෝ මුළු අස්වැන්නෙන් පනත යටතේ නියමිත අය කිරීමේ ප්‍රමාණය අඩු කළ විට, ඉතිරි කොටසින් 1/4 කට නොවැඩි කොටසක්

යන දෙකෙන් වඩා වැඩි ප්‍රමාණය බද්ද වශයෙන් ගෙවිය යුතු ය. මෙය විවිධ පරිපාලන දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් හෝ පරිපාලන දිස්ත්‍රික්කයක විවිධ කොටස් සම්බන්ධයෙන් වෙනස් විය හැක.

2000 - එක් එක් කුඹුරු අක්කරයකින් වී බුසල් 10 කට නොඅඩු ගණනක් හෝ මුළු අස්වැන්නෙන් පනත යටතේ නියමිත අය කිරීමේ ප්‍රමාණය අඩු කළ විට, ඉතිරි කොටසින් 1/4 පංගුවකට නොඅඩු කොටසක් හෝ යන දෙකෙන් වඩා වැඩි ප්‍රමාණය එක් එක් කන්නය සඳහා ගෙවිය යුතු බද්ද වේ. මෙම බද්ද විවිධ පරිපාලන දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් හෝ පරිපාලන දිස්ත්‍රික්කයක විවිධ කොටස් සම්බන්ධයෙන් වෙනස් විය හැක.

"අක්කරයකට බුසල් 14 (මහා වාරිමාර්ග) සහ සුළු වාරි යටතේ බුසල් 12 ක් වශයෙන් දැනට කරගෙන යන ආකාරයට ම පැවතිය යුතු ය" යන්න, අඳගොවීන් සියළුදෙනාගේ ම මතය යි. මුළු අස්වැන්නෙන් 1/4 ක් ගෙවීම ගැටළු මතු කරවන්නකි. අස්වනු වංචා කිරීමට මෙම ක්‍රමය නිසා අඳ ගොවියාට ඉඩකඩ ලැබේ. ඉඩම් හිමියාත්, අඳ ගොවියාත් අතර විශ්වාසය පළුදු වීමටත් සුහදතාවය නැති වීමටත් මෙය හේතු වේ. එසේ ම නිෂ්පාදන වියදම් අධික වීම නිසා ද "1/4 ක් ඉඩම් හිමියාට ප්‍රවේණිය ලෙස ගෙවීම අවශ්‍ය නොවේ ය" යන්න හම්බන්තොට හා අනුරාධපුර දිස්ත්‍රික් ගොවීන්ගේ අදහස විය. ඉඩම් හිමියන්ගේ අදහස වූයේ, වර්තමානයේ අස්වනු වැඩියෙන් ලැබෙන බැවින් එහි ප්‍රතිලාභ ඉඩම් හිමියාට ද ලැබිය යුතු බව යි. අඳ ගොවි ක්‍රමය දිගට ම පවත්වා ගෙන යාමට නම්, අස්වනු වැඩිවීම සමඟ සලකා බලා ඉඩම් හිමියාට ගෙවන ප්‍රවේණිය වැඩි කළ යුතු බව ඉඩම් හිමියන්ගේ අදහස යි. ගෙවන ප්‍රවේණිය එක් එක් දිස්ත්‍රික්කයේ විවිධ ප්‍රදේශ අනුව තීරණය කළ යුතු අතර, මෙය "කන්නයෙන් කන්නයට වෙනස් නො වන නිශ්චිත ප්‍රවේණියක් විය යුතු ය" යන්න නිලධාරීන්ගේ මතය විය.

ශ්‍රී ලංකාවේ විවිධ දිස්ත්‍රික්කවල වී වගාවේ අස්වනු ඒකාකාරී ස්වභාවයක් නො ගන්නා බැවින් එක් එක් දිස්ත්‍රික්කවල විවිධ කොටස්වල වර්තමාන සාමාන්‍ය වී අස්වැන්න ගණනය කර, ඒ අනුව එක් එක් දිස්ත්‍රික්කයේ ප්‍රවේණිය ගණනය කළ යුතු ය. ඒ අනුව හම්බන්තොට වැනි ඉහළ අස්වනු ලැබෙන දිස්ත්‍රික්කයක දී ඉහළ ප්‍රවේණියක් ද අඩු අස්වනු ලැබෙන දිස්ත්‍රික්කයක දී අඩු ප්‍රවේණියක් ද ගොවිජන කොමසාරිස්වරයා විසින් ගැසට් මඟින් දන්වනු ලැබිය යුතු ය.

### 6.6 ගොයම් කපා, පෑගීමේ සහ ඉවත් කිරීමේ දින අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට දැනුම් දෙනු ලැබීම.

1958- මෙවැන්නක් සඳහන් නොවේ.

1979- අස්වැන්න කපා පාගා ගැනීම ආරම්භ කිරීමට අදහස් කරන දිනය අවම වශයෙන් දින 10 ක් ඇතුළත සහ අස්වැන්න කමතෙන් ඉවත්කර ගැනීම අවම වශයෙන් දින 7 ක් ඇතුළත අඳ ගොවියා විසින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

2000- 1979 පනත පරිදි ම වේ.

'නිශ්චිත ප්‍රමාණයක් ප්‍රවේණිය ලෙස ගෙවීම නිසා එලෙස කල්තබා දැනුම් දීම අවශ්‍ය නොවේ ය' යන්න අඳ ගොවීන්ගේ අදහස විය. නිලධාරීන්ගේ හා ඉඩම් හිමියන්ගේ මතය වූයේ, එලෙස නිශ්චිත දිනයක් දැනුම් දීම අවශ්‍ය බව යි. හේතුව, එසේ නොමැති විට විවිධ අස්වනු වංචා සිදුවීමට ඉඩකඩ තිබීමත්, තත්ත්වයෙන් බාල වී ප්‍රවේණිය ලෙස ගෙවීමත් ක්ෂේත්‍රයේ බහුල ව සිදුවන බැවිනි.

### 6.7 බද්ද ගෙවිය යුතු කාල සීමාව සහ බද්ද හිඟ වීම ආරම්භ කිරීම.

1958 - යම් කන්නයකට ගෙවිය යුතු බද්ද එම කුඹුරෙන් අස්වැන්න ලබා ගැනීමෙන් අනතුරු ව 30 වන දිනයේ හෝ ඊට පෙර ගෙවිය යුතු ය. එසේ නොවුන හොත් එම 30 වන දිනයට පසු පළමු දිනයේ පටන් බද්ද හිඟ වීමට පටන් ගනී.

1979 - 1958 පනත පරිදි ම වේ.

2000 - අස්වැන්න ලබා ගැනීමෙන් අනතුරු ව 15 දිනයේ හෝ ඊට පෙර කමතේ දී බද්ද ගෙවිය යුතු අතර, එසේ නො ගෙවුව හොත් එම 15 දිනයට පසු පළමු දිනයේ සිට බද්ද හිඟ වීමට පටන් ගනී. 'කම්කරුවන් සොයා ගැනීමට අපහසු වීම, යන්ත්‍රෝපකරණ සොයා ගැනීමට අපහසු වීම ආදී හේතු නිසා ප්‍රවේණිය ගෙවීම සඳහා දින 30 ක සීමාවක් ඇති කළ යුතු ය' යන්න අද ගොවින්ගේ අදහස විය.

## 7. නිගමනය

දශක ගණනාවක් තිස්සේ විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් ක්‍රියාත්මක වූ අඳ ගොවි ක්‍රමය වර්තමානය වන විට විවිධ හැළ හැප්පීම්වලට තක් වෙමින් පවතින අතර, 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත නිසා ඉඩම් හිමියන් මෙන් ම අඳ ගොවිහු ද විවිධ අපහසුතාවයන්ට හා ප්‍රශ්නවලට මුහුණපා සිටිති. එම නිසා දෙපාර්ශ්වය ම තෘප්තිමත් වන අයුරින් වඩාත් සාධාරණ වූ ද සුරක්ෂිත වූ ද අඳ ගොවි පනතක් සකස් කිරීම කාලීන අවශ්‍යතාවයකි.

## 8. නිර්දේශ

1. වර්ෂ 2000 අඳ ගොවි පනත මඟින් අසාධාරණයට ලක් වූ ගොවින්ට සහන සැලසීම සඳහා නව පනත 2000 සිට බලාත්මක වන අයුරින් ක්‍රියාත්මක කිරීම.
2. වර්ෂ 2000 පනත අනුව මෙතෙක් අඳ ගොවිතැනින් නෙරපා දූ අයට වන්දියක් ලබා දීම.
3. ඉඩම් බැංකු පිහිටුවා සාධාරණ ණය ක්‍රමයක් යටතේ අඳ ගොවින්ට තමන් වගා කරන ඉඩම මිල දී ගැනීම සඳහා පහසුකම් සැලසීම.
4. වර්ෂ 2000 පනත නිසා ඒකරාශී වී ඇති නඩු විසඳීමට ගොවිජන විනිශ්ච සභා පිහිටුවීමට හැකි ඉක්මනින් ක්‍රියා කිරීම.
5. අලුතින් උපරිම සීමා නියම නො කොට අඳ ගොවින් විසින් වර්තමානයේ වගා කෙරෙමින් පවතින කුඹුරු ඉඩම් ප්‍රමාණය ම අනාගතයේ දී ද වගා කිරීමට ඉඩ ලබාදීම.
6. අඳ ගොවියා සහ ඉඩම් හිමියා යන දෙපාර්ශ්වයේ කැමැත්ත මත කුඹුරු ඉඩම 50% බැගින් බෙදා ගැනීමට ඉඩ ප්‍රස්ථා ඇති කිරීම.
7. ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානවල ඇති අඳගොවි නාම ලේඛන මෙන් ම ඒවායේ ඇතුළත් දත්ත දීර්ඝ කාලයක් තිස්සේ යාවත්කාලීන කර නොමැති බැවින් එම ලේඛන හා තොරතුරු යාවත්කාලීන කිරීම.
8. කොමසාරිස් ජනරාල් සතු බලතල විමධ්‍යගත කිරීම හා දිස්ත්‍රික්කයේ කොමසාරිස්, ගොවිජන සංවර්ධන නිලධාරීන් හා කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්ට වැඩි බලතල ලබා දීම (උදා. පාවර ඇරෙන විට, ඇළ මාර්ග අවහිර වීම්, වක්කඩ කැඩී තිබීම).

9. අද ගොවීන් අකාර්යක්ෂ ම ලෙස කුඹුරු වගා කිරීමට එරෙහි වීමට 2000 පනත මගින් බලතල ඇති නමුත්, එය වර්තමානයේ බලාත්මක නොවේ. මෙවැනි ඉඩම් අසන්තක කර වසර 10 ක පමණ කාලයකට ගොවි සංවිධානයට හෝ වෙනත් පුද්ගලයකුට වගා කිරීමට බලය දීම.

10. ආගමික ස්ථානවලට අදාළ අද ගොවීන් ප්‍රවේණිය ලබාදීම නිසි පරිදි සිදු නො වන බැවින් අදාළ නීතිරීති දැඩි කිරීම.

11. ගොවිතැනේ ඇති සාරධර්ම, අද ගොවියා හා ඉඩම් හිමියා අතර ඇති සුහදත්වය, අන්‍යෝන්‍ය අවබෝධය නැවතත් ඇති කිරීම.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. අයිවන්, වික්ටර් (1978). අද ගොවිතැනේ අභියෝගය.

2. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,(1958). අංක 21 දරණ කුඹුරු පනත. කොළඹ.

3. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,(1979). අංක 58 දරණ ගොවිජන සේවා පනත. කොළඹ.

4. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,(1991). අංක 4 දරණ ගොවිජන සේවා පනත (සංශෝධිත). කොළඹ.

5. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,(2000). අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත, කොළඹ.

6 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු වාර්තා, හම්බන්තොට.

7. පෙරමුණෙේ,පී.ඒ.සී. (1992). ගොවි අදය හා ඉඩම් හිමියා (නීතිය හා පරිචය)

8. මහින්ද චින්තන ඉදිරි දැක්ම, (2010). පිටුව 83.

9. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,(1957 දෙසැම්බර් 12). හැන්සාඩ් වාර්තාව.

10. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,(2000 අගෝස්තු 10). හැන්සාඩ් වාර්තාව.

11. Wanigaratne, R.D. (1977). Family Dominance in Village Society : The Mahantegama Village. ARTI, Colombo 07.